# සහෝදර කිෂෙන්ජි අමරණීයයි!

## (සහෝදර කිෂෙන්ජි පිළිබඳ මතකය අවදි කිරීම - දිවි පිදුමෙන් පළමු වස් අනුස්මරණය)

ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය ලෝක විප්ලවීය සටන් බිමේ සුවිශේෂී අරගලයක් ගෙන යයි. එය ඉතා නොදියුණු කොටස් ලෙස කලින් ලෝකයා සැලකූ ආදිවාසී ජනතාව මාඕවාදයේ ශ්‍රේෂ්ඨ මතවාදයෙන් පණ පොවා අභීත දූ පුතුන් ලෙස ලෝක විප්ලව රණ බිම වෙත දයාද කළහ. සතුරා වෙත ඉන්දීය සහෝදරවරු මාරක ප්‍රහාර එල්ල කොට අධිරාජ්‍යවාදීන්ගේ ලොමු දැහැ ගන්වන විට එය ලෝක විප්ලවීය ජනතාවගේ අමන්දනන්දයට හේතු වූවාට කිසි සැකයක් නැත.

2011 නොවැම්බර් 24 වන දින සහෝදර කිෂෙන්ජි සතුරා විසින් මනාව සැලසුම්කොට පණ පිටින් අල්ලාගෙන, කුරිරු ලෙස, ඉතා බියගුලු ක්‍රමයකට ඝාතනය කරන ලදි. එම පුවත ලෝක නිර්ධන පංති ජනතාවට මෙන්ම අපට අතිශය සංවේගදායී පුවතක් විය. අපේ හදවත් තුළ ලැගුම් ගෙන සිටි ආදරණීය සොහොයුරා, පරමාදර්ශී නායකයා, ශ්‍රේෂ්ඨ රණකාමියා, ගරිල්ලා සෙන්පති වූ සහෝදර කිෂෙන්ජි ලෝක විප්ලවීය රංග මඬලට අහිමි වීම අප කිසිසේත්ම බලාපොරොත්තු නොවූ මෙන්ම අපට දරාගත නොහැකි දෙයක් විය.

ලේ පිපාසිත ඉන්දීය පාලක පංතිය කලින් ඉන්දීය මාඕවාදී කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙකු වූ සහෝදර අෂාඩ් මරා දැමූහ. එලෙසින් ඔවුහු විප්ලවයේ ඉහළ පෙලේ නායකයින් ව්‍යාජ සටන් වලින් ඝාතනය කරමින්, සිර කඳවුරු තුළ සඟවමින්, ආදරණීය ජනතාව වෙතට සංහාරයන් දියත් කරමින් විප්ලවය වල දැමීමට කැස කැවූහ.

ඉන්දියානු විප්ලවයේ ප්‍රගමනය සඳහා සහෝදර කිෂෙන්ජි අමරණීය දායකත්වයක් සපයා ඇත. ඔහුගේ පරමාදර්ශී ගරිල්ලා ජීවිතය ඉන්දියාවේ පිටිසරබද භූමි සිසාරා විප්ලවයේ ගිනිසිළුව පතුරුවා ලීය. ඔහු විසි කළගිණි පුපුරු නැවත නැවත බුර බුරා ඇවිලෙනු ඇත. අසාමාන්‍ය හැකියාවන්ගෙන් යුතු කොමියුනිස්ට්වාදියෙකු වූ ඔහු ගේ දිවි පිදීම ඉන්දියානු විප්ලවයට මෙන්ම ලෝක විප්ලවයට බලවත් පාඩුවක් බවට කිසිදු සැකයක් නැත.

නින්දිත සංශෝධනවාදී ක්‍රමවලින්, විප්ලවය පාවාදී අධිරාජ්‍යගැති ධනපති පාලකයින්ගේ අභිලාෂයන් ඉටු කිරීමට ඉදිරියට පැමිණි අවස්ථාවාදීන්ට සහෝදර කිෂෙන්ජි සිය ගිනි අවියේ දේශපාලනයෙන් කදිමට පිළිතුරු දුන්හ. මෑතදී කරලියට පැමිණි කලින් විප්ලවීය ජාත්‍යන්තරවාදී ව්‍යාපාරයෙහි සාමාජිකයින් වූ නේපාලය සමහර දේශපාලන පක්ෂවල නව මාදිලියේ සංශෝධනවාදය හමුවේ ලෝක නිර්ධන පංති විප්ලවයට බලවත් පාඩු සිදු විය. සමහර ප්‍රදේශවල ජනතාවගේ අභීත කැපකිරීම් ඵල රහිත විය.

සහෝදර කිෂෙන්ජිගේ නිර්මල දේශපාලන දිවිමග සැබෑ විප්ලවවාදියෙකු සහ විප්ලවීය නායකයෙකු මෙන්ම අභීත ගරිල්ලා සටන් කරුවෙකු පිළිබඳ පරමාදර්ශයක් සැපයීය. කුරිරු ලෙස වධ දී ඔහුව මරා දමද්දීත් සිය ජීවිතයෙන් පක්ෂයේ රහස් ආරක්ෂා කළ ඔහු සිය මරණයෙන් පවා සතුරා පරාජයට පත් කළහ. ඉන්දියානු කුලී ඝාතක හටයින්, ඔහු ඉදිරියේ කෙතරම් බෙලහීනද යන්න ඔහුව ඝාතනයට භාවිතා කළ නින්දිත ක්‍රමවේදයන්ගෙන් මනාව පැහැදිලි වෙයි.

මියෙන මොහොත දක්වා සහෝදර කිෂෙන්ජි තරුණ ජීවයකින් යුතුව දිවා රෑ දෙකෙහිම විප්ලවය වෙනුවෙන් වැඩ කළහ. විප්ලවයෙන් පසු බිහිවෙන සුන්දර අනාගතය ගැන ඔහු සුන්දර සිහින දුටහ. ඔහුගේ මරණයෙන් පසු එම විප්ලවයේ සිහිනය ජනතාව වෙතින් ඉවත් කිරීමට ධනේශ්වර පාලක පංතිය අපේක්ෂා කළද, එය වඩ වඩා ජීව මාන ලෙස ජනතාව අතරත් අප රටේ විප්ලවීය සගයින් අතරත් මුල් බැස ගත්හ. අමානුෂික ලෙස සහෝදර කිෂෙන්ජි ඝාතනය කිරීම අපගේ හදවත් මෙන්ම අපගේ නහර වැල් වල දුවන රුධිරය පවා කෝපයෙන් මුසපත් කළහ. අපි ඔහුගේ ආශ්වාදජනක විප්ලවීය ජීවිතය වඩ වඩාත් තුරුලු කර ගන්නෙමු. ඔහුගේ නිර්භීත වික්‍රමයන් විප්ලවීය සටන්කරුවන්ට ආශ්වාදජනක පුරාවෘත්තයන් වනු ඇත. අපි අපගේ සොහොයුරන්ට පවසන්නේ කිෂෙන්ජි වැනි අභීත, දැඩි, අවංක සහ විප්ලවීය න්‍යායෙන් සන්නද්ධ වුණු විප්ලවවාදියෙකු වන ලෙසයි. මේ දුෂ්කර වකවානුවට අවශ්‍ය වන්නේ ඔහු වැනි දුෂ්කරතාවයන්ගෙන් පන්නරය ලද විප්ලවවාදීන්ය, නායකයින්ය.

''ඔබ සහෝදර කිෂෙන්ජි වැන්නෙකු විය යුතුය. මේ භූමිය තුළ විප්ලවීය ව්‍යාපාරය දියුණු කිරීමේ භාරදූර්ය කාර්යයට කර ගසමින් අපි ඔහුට අපගේ සැබෑ උපහාරය පෙන්වන්නෙමු. අපගේ සොහොයුරන්ගෙන් අපි ඉල්ලා සිටින්නේ එයයි.''

''මාඕවාදයේ ශ්‍රේෂ්ඨ මතවාදය පතුරවන්න, ජනතාව අතර මුල් බැස ගන්න, හැකි සෑම අයුරකින්ම විප්ලවීය අරගලයට සහය දෙන්න. ලෝක විප්ලවයට දායක වීම සඳහා බලවත් විප්ලවීය කොමියුනිස්ට් පක්ෂයක් ගොඩ නැගීම දක්වා යන ගමන සඵල කර ගැනීමට අපගේ කණ්ඩායමේ ශක්තිය වැඩි කර ගැනීමට, විප්ලවීය න්‍යායන් වඩ වඩාත් ග්‍රහණය කර ගැනීමට අපි අදිටන් කර ගනිමු.''

ඉන්දියානු විප්ලවය අපගේ විප්ලවයයි. එහි ජයග්‍රහණය අපගේ ජයග්‍රහණයයි. එහි පරාජය අපගේ පරාජයයි. ඉන්දියානු සොහොයුරන්ට දැනෙන සංවේදනය අපටද දැනෙනු ඇත.

භගත් සිං, චාරු මජුම්දර්, කන්හයි චටර්ජී, අෂාඩ් සහ කිෂෙන්ජි මෙන්ම දහස් ගණන් දිවි පිදූ විප්ලවීය සටන් කරුවන් ජනතාව අතරින් විප්ලවීය රණ බිමට පරිත්‍යාග කොට ඇත. ජනතාව වූ කලී විරත්වයේ නොසිඳෙන උල්පතයි. එය තව තවත් සටන් කරුවන්, නායකයින් ලෝක විප්ලවයේ සටන් බිම වෙත ලබා දෙනු ඇත. එය කොටෙස්වාර්ලුන් දහස් ගණනකට උපත ලබා දෙනු ඇත.

ජනතාවගේ ඉමහත් වෛරය හමුවේ ඉන්දීය පාලක පංතිය දේශපාලනිකව හුදෙකලා වී ඇත. නැගෙනහිර ඝාටිස් කඳු වැටි සහ දන්දකර්ණයා, අන්ද්‍රා වන පෙදෙස්වල මෙන්ම ලාල්ගාර්හ් බටහිර බෙංගාලය වැනි විප්ලවීය සටන් බිම් වල සහෝදර කිෂෙන්ජිගේ ගිනි අවියෙහි හඬ දිගටම ඇසෙනු ඇත. විප්ලවීය සටන මෙහෙයවන ඔහුගේ තරුණ කටහඬ, ගරිල්ලා භටයින්ට අණ දෙන ඔහුගේ තරුණ කටහඬ වන බිම්වල, මිටියාවත්වල, කඳුවැටි වල, ගම් දනව්වල සදහටම රැව් දෙනු ඇත. ඔහු ගිය මාවත දිගේ පිය නගන ඔහුගේ දරුවන්, දහස් ගණන් කිසෙන්ජිවරු ඉන්දියානු විප්ලවය විජයග්‍රාහී මාවත වෙතට ගෙන යනු ඇත.

**සහෝදර කිෂෙන්ජි අමරණීයයි!**
**ඉන්දියානු විප්ලවය වෙනුවෙන් දිවි පිදූ දහස් ගනන් සටන් කරුවන්ට විප්ලවීය උත්තමාචාරය පුද කරමු!**
**ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) දිගු කල් දිනේවා!**
**ඉන්දියානු විප්ලවය දිගු කල් දිනේවා!**
**මාක්ස් ලෙනින් මාඕවාදය දිගු කල් දිනේවා!**

**නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායම (NMSG)**
**ශ්‍රී ලංකාව**